සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 09/2025

මගේ අංකය - PPSC/ES/10/FI/06/01-08
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත - රත්නපුර.
2025.03. 18

01. ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය, සබරගමුව පළාත් සභාව
02. ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, සබරගමුව පළාත් සභාව
03. සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය, සබරගමුව පළාත් සභාව
04. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් ,සබරගමුව පළාත් සභාව
05. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සබරගමුව පළාත
06. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, රත්නපුර/කෑගල්ල

## <u>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ 1 ශ්‍රේණියට නියමිත තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025</u>

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් 3 පන්තියේ I ශ්‍රේණියට පත්වී වසර 05 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත්වීම අවශ්‍ය වේ.

02. එබැවින් එම විභාගය සඳහා ඉදිරිපත් වන 3 පන්තියේ I ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන්ගෙන් මින් අයදුම්පත් කැඳවනු ලැබේ.අදාළ විභාගය **2025 මැයි/ජූනි** මාසයේ පැවැත්වීමට අපේක්ෂිතය. **මෙම චක්‍රලේඛ ලිපිය ඔබ ආයතනයේ හා ඔබ යටතේ ඇති අනෙකුත් කාර්යාලවල සේවය** කරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර දරන 3 පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ **දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.**

03. මෙම චක්‍රලේඛ ලිපියේ පසු පිටේ සඳහන් ආදර්ශ අයදුම්පත ප්‍රකාර සකස් කරගත් අයදුම්පතක් මගින් විභාගයට අයදුම් කළ යුතු වේ. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු ඉදිරියේ අයදුම්කරු අත්සන් කර ඔහුට භාර දිය යුතුය. ආයතන ප්‍රධානියා විසින් එම අයදුම්පත **2025.04.11** දිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැල මගින් මා වෙත එවිය යුතුය.

04. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **<u>අයදුම්කරුවන් ඉදිරිපත්ව නොමැති නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් මා දැනුවත්</u>** කරන මෙන් කාරුණිකව දන්වමි.

05. විභාගයෙන් සමත්වීම සඳහා එක් විෂයයක මුළු ලකුණු 50ක් ලබා දෙන අතර <u>සමත්වීම සඳහා අවම ලකුණු 20ක් හෝ ඊට ඉහළ ලකුණක්</u> ලබා ගත යුතුය.

06. **මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ** www.psc.sg.gov.lk හා **සබරගමුව පළාත් වෙබ් අඩවියට** www.sg.gov.lk යොමු කර ඇත.

07. ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ලිඛිත පරීක්ෂණය | පැය 01 | 50 | 20 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ප්‍රායෝගික පරීක්ෂණය | පැය 01 | 50 | 20 |

08.විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය<br>ලිඛිත පරීක්ෂණය | I.කාර්යාලීය කටයුතු සඳහා මෘදුකාංග භාවිතය හා ඒ පිළිබඳ දැනුම<br><br>II. පරිගණක ජාල පිළිබඳ දැනුම<br><br>III.පරිගණක මෘදුකාංගයන්හි/දෘඩාංගයන්හි දෝෂ හඳුනාගැනීම සහ ඒවා නිරාකරණය කිරීම පිළිබඳ දැනුම. |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රායෝගික පරීක්ෂණය | I.කාර්යාලීය කටයුතු සඳහා මෘදුකාංග භාවිතයේ ප්‍රායෝගික දැනුම<br><br>II. පරිගණක ජාල පිළිබඳ ප්‍රායෝගික දැනුම<br><br>III. පරිගණක මෘදුකාංගයන්හි/දෘඩාංගයන්හි දෝෂ හඳුනාගැනීම සහ ඒවා නිරාකරණය කිරීම පිළිබඳ ප්‍රායෝගික දැනුම. |

09. මීට පෙර මෙම විභාගය පැවති අවස්ථාවලදී විභාගය අසමත් වී නැවත අයදුම් කරන්නේ නම් එක් විෂයයකට රු. 250/-ක විභාග ගාස්තුවක් ද ගෙවිය යුතුය. සමස්ත විභාගය සඳහා නම් රු 600/= ගාස්තුවක් ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව මෙම පළාත් සභාවේ අමාත්‍යාංශ කාර්යාලයකට දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. එසේ ගෙවන විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 20.03.02.99 ආදායම් ශීර්ෂයට බැරවන සේ ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පිටුපස නොගැලවෙන සේ ඇලවිය යුතුය.

10. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් හෝ කොමිෂන් සභාව වෙනුවෙන් බලය පවරන ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

11. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පවත්වන දිනය, ස්ථානය හා වේලාව විභාග ප්‍රවේශ පත්‍ර මගින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

12. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඩබ්.ආර්.දිනීෂා එස්.රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ
3 පන්තියේ /1 ශ්‍රේණියට අදාළ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

01 අයදුම්කරුගේ සම්පූර්ණ නම: -..........................................................................

02 මුලකුරු සමඟ නම : -..........................................................................
(මයා/මිය/මෙනවිය යනුවෙන් සඳහන් කරන්න)

03 දැනට සේවය කරන ස්ථානයේ රාජකාරී ලිපිනය :-...............................................
(විභාග ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට ...............................................
තැපැල් කරනු ලැබේ) ...............................................

04 දුරකථන අංකය : - 1. රාජකාරී.............................

2. පෞද්ගලික..........................

05. මුල් පත්වීම් දිනය : -.......................................

06. ජාතික හැඳුනුම්පත් අංකය:- ...............................................

07. 3 පන්තියේ I ශ්‍රේණියට උසස් වූ වර්ෂය :- .................................

08. ඔබ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වී තිබේ ද? ..............

09. විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයය: - 01...............................................................
02...............................................................

10. විභාගයට පෙනී සිටින වාර ගණන :-................
11. විභාගයට පෙනී සිටින මාධ්‍යය:- සිංහල/දෙමළ

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම් සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

.......................................
අයදුම්කරුගේ අත්සන

දිනය ...............................

## අයදුම්කරු සේවය කරන ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම කාර්යාලයේ සේවය කරන තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ /1 ශ්‍රේණියේ නිලධාරියෙකු බවත්, ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති අයෙකු බවත්, ඔහු/ඇය මා ඉදිරියේදී මෙම අයදුම්පත්‍රයේ අත්සන් තැබූ බවත් මින් සහතික කරමි. ඉහත නම් සඳහන් ..........................................ජාතික හැඳුනුම්පත් අංක දරණ අපේක්ෂකයාට විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති/නැති බව නිර්දේශ කරමි.
(නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න.)

...................................
ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියාගේ අත්සන
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

දිනය -............................